

# 17 දරුවන් සදාවඩා ගැනීම ❶

දරුවන් සදාවඩා ගැනීමේදී ඔවුන්ගේ වර්ධනය සඳහා ජපන් රජය විසින් මාෂිකව පිරිනමනු ලබන සහනාධාර මුදලක් ඇත. ඒ වගේම දරුවන්ට රෝහලෙන් ප්‍රතිකාර ලබාගැනීමේ දී, ඒ සඳහා මුදල් වැය නොවන සේවාවන් ඇත.
වැඩි විස්තර දැනගැනීම සඳහා නගර සභාවේ ＜ ළමා ආරක්ෂණ ආධාරක අංශය ( *Kosodate Shienka* ) ＞ වෙත පැමිණෙන්න.

## (１) ළමා දීමනාව(දරුවන් හදාවඩා ගැනීම සඳහා ලැබෙන සහනාධාර මුදල්) ( *Jidō Teate* ) (සහනාධාර මුදලක් පිරිනැමෙනු ලැබේ )

දරුවාට අවුරුදු 15 දක්වා ＜කණිෂ්ඨ ද්විතික පාසැල අවසන් වන තෙක් ＞ ලැබෙන සහනාධාර මුදල් වේ. නගරසභාවේ ＜ ළමා ආරක්ෂණ ආධාරක අංශය ( *Kosodate Shienka* ) ＞වෙත ගොස් මෙම සේවාව සඳහා ඉල්ලුම් කළහැක.





＜ නගරසභා කාර්යාලයට යනවිට රැගෙන යායුතු දේ ＞

① බැංකු පොත ( *Tsūchō* )

② <u>පෞද්ගලික අංකය සහිත කාඩ්පත ( *Kojin Bangō Kādo* ) ＜ *Mainanbā Kādo* ＞</u>

## (２) රෝහලට යන අවස්ථාවේදී වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම ( *Kodomo Iryōhi* ) ( රෝහල් ගාස්තුවකින් තොරව ප්‍රතිකාර ලබාගැනීම )

දරුවන්ට අවුරුදු 15 දක්වා ＜ ද්විතික පාසැල අවසන් වන තෙක් ＞ රෝහලට මුදල් ගෙවීම අවශ්‍ය නොවේ. ප්‍රථමයෙන්ම දරුවාව <u>සෞඛ්‍ය රක්ෂණය ( *Kenkōhoken* )</u> ට ඇතුල් කරන්න.
නගරසභාවේ ＜ ළමා ආරක්ෂණ ආධාරක අංශය ( *Kosodate Shienka* ) ＞ වෙත ගොස් මෙම සේවාව ඉල්ලුම් කළහැක.

රෝහලේ දී ගෙවන ලද මුදල් නැවත ලබාගැනීමට හැකිය

＜නගරසභා කාර්යාලයට යනවිට රැගෙන යායුතු දේ＞

① සිල් එක ＜ *Hanko* ＞

② දරුවාගේ <u>සෞඛ්‍ය රක්ෂණ පත ( *Kenkōhokensho* ) ＜ *Hoken Kādo* ＞</u>

③ දෙමාපියන්ගේ සහ දරුවාගේ <u>පෞද්ගලිකඅංකය සහිත කාඩ්පත</u>
<u>( *Kojin Bangō Kādo* ) ＜ *Mainanbā Kādo* ＞</u>

④ දරුවා පාසලට යනබව තහවුරු කළහැකි ලියවිල්ලක්, <u>පාසැලේ ශිෂ්‍ය හැඳුනුම්පත</u>
<u>＜ *Gakkō no Mibun Shōmeisho* ＞</u>

⑤ බැංකු පොත ( *Tsūchō* )



## （3）රෝහලෙන් ප්‍රතිකාර ලබාගැනීමේදී උසස් පාසලේ දරුවන් සඳහා වූ සේවාව (*Kōkōseitō Iryōhi*) (උසස් පාසැල් සිසුන් සඳහා වෛද්‍ය සහනාධාරය　)

දරුවා කණිෂ්ඨ ද්විතික　පාසැලෙන් සමුගත් විට අවුරුදු 18 දක්වා ＜ පාසල් කාලය අවසන වන තෙක් ＞ රෝහලෙන් බෙහෙත් ලබාගැනීමේදී වෛද්‍ය ප්‍රතිකාර සඳහා වැයවූ මුදල් නැවත ලබාගතහැකි ක්‍රමයක් ඇත. නගරසභාවේ ＜ ළමා ආරක්ෂණ ආධාරක අංශය (*Kosodate Shienka*) ＞ වෙත ගොස් මෙම සේවාව ඉල්ලුම් කළහැක.

රෝහලෙන් ප්‍රතිකාර ගත විට　වැයවූ මුදල් නැවත ලබාගත හැක.

＜ නගරසභාවට යනවිට රැගෙන යායුතු දේ ＞




① සිල් එක ＜ *Hanko* ＞
② දරුවාගේ <u>සෞඛ්‍ය රක්ෂණ පත (*Kenkōhokensho*) ＜ *Hoken Kādo* ＞</u>
③ දෙමාපියන්ගේ සහ දරුවාගේ <u>පෞද්ගලිකඅංකය සහිත කාඩ්පත (*Kojin Bangō Kādo*) ＜ *Mainanbā Kādo* ＞</u>
④ දරුවා පාසලට යනබව තහවුරු කළහැකි ලියවිල්ලක්, <u>ශිෂ්‍ය හැඳුනුම්පත ＜ *Gakusei Shōmeisho* ＞</u>
⑤ රිසිට් පත
⑥ බැංකු පොත (*Tsūchō*)

◎ 69 පිටුවේ සහ 70 පිටුවේ අමාරු වචන ◎

※සෞඛ්‍ය රක්ෂණ පත (*Kenkōhokenshō*) ＜ *Hoken Kādo* ＞ : 23 පිටුවේ සිට 26 පිටුව දක්වා කියවා බලන්න｡

※පෞද්ගලික අංකය සහිත කාඩ්පත (*Kojin Bangō Kādo*) ＜ *Mainanbā Kādo* ＞ : අංක12කින් යුත් තමන් සඳහා පමණක් වූ කාඩ්පත

※සෞඛ්‍ය රක්ෂණය (*Kenkōhoken*) : 23 පිටුවේ සිට 26 පිටුව දක්වා කියවා බලන්න｡

※ශිෂ්‍ය හැඳුනුම්පත (*Gakusei Shōmeisho*) : පාසලේ ශිෂ්‍යයෙක් බව සඳහන් කර ඇති කාඩ් පතකි. ශිෂ්‍යයින්ට පාසලෙන් ලබා ගත හැක. ＜ *Gakuseishō* ＞ යැයි සඳහන් කරන ශිෂ්‍ය හැඳුනුම්පත වේ.

| වැඩි විස්තර දැනගැනීම සඳහා (විමසීම) | ලිපිනය | දුරකථනඅංකය |
|---|---|---|
| ළමා　ආරක්ෂණ ආධාරක අංශය (*Kosodate Shienka*) | 296 බන්චි,තොනොදයි,සන්මුනගරය (296,Tonodai,Sammu-shi) | 0475-80-2631 |

＜ විමසීම් කළ හැකි වේලාවන් ＞ සඳුදා සිට සිකුරාදා දක්වා පෙරවරු8.30සිට පස්වරු 5.00 දක්වා

※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.